රුහුණ විශ්වවිද්‍යාලය

විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධි තෙවන ස්ථල (ප්‍රථම සමාසික) පරීක්ෂණය

ජූනි/ජූලි-2015


**විෂය : කළමනාකරණය**

පාඨමාලා ඒකකය : FSC 3112 කාලය : පැය 02 යි.

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

---

01. (i) උදාහරණයක් මගින් "කාර්යක්ෂමතාව" අර්ථ දක්වන්න.

(ලකුණු 03)

(ii) කළමනාකරණ ක්‍රියාවලිය කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 03)

(iii) හෙන්රි මින්ට්ස්බර්ගේ කළමනාකරණ භූමිකාවන් විස්තර කරන්න.

(ලකුණු 03)

(iv) "විධාන ඒකීයතාවය" යන මූලධර්මයෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 03)

(v) සංවිධාන ව්‍යුහයක ප්‍රධාන මූලිකාංග මොනවාද?

(ලකුණු 03)

(මුළු ලකුණු 15)

02. (i) "මානව සම්පත් කළමනාකරණය" යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 04)

(ii) මානව සම්පත් කළමනාකරණ ක්‍රියාවලිය කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(iii) සංවිධාන අරමුණු සාධනය කර ගැනීම සඳහා මානව සම්පත් කළමනාකරණයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 15)

03. (i) "විද්‍යාත්මක කළමනාකරණය" යනු කුමක්ද?

(ලකුණු 04)

(ii) හෙන්රි ෆෙයෝල්ගේ කළමනාකරණ මූලධර්ම කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(iii) "විද්‍යාත්මක කළමනාකරණය" සඳහා එෆ්.ඩබ්. ටේලර්ගේ දායකත්වය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 15)

04. (i) නායකයෙකු සහ කළමනාකරුවෙකු අතර වෙනස්කම් ඔබ විස්තර කරන්නේ කෙසේද?

(ලකුණු 04)

(ii) නායකත්වය පිළිබඳ ගති ලක්ෂණ න්‍යාය විස්තර කරන්න.

(ලකුණු 05)

(iii) සංවිධානයක් තුළ නායකත්ව භූමිකාව භාවිතා කිරීම සඳහා ගති ලක්ෂණ වල වැදගත්කම විස්තර කරන්න.

(ලකුණු 06)

(ලකුණු 15)

05. පහත සඳහන් මාතෘකා යටතේ කෙටි සටහන් තුනක් ලියන්න.

(i) සඵලදායි පාලන පද්ධතියක ලක්ෂණ

(ii) ඒකාධිපති නායකත්වය සහ ප්‍රජාතන්ත්‍රවාදී නායකත්වය

(iii) අවශ්‍යතා ධූරාවලි න්‍යාය

(iv) සංවිධාන පරිසරය

(v) අභිප්‍රේරණයෙහි සඳහන් ද්වි සාධක න්‍යාය

(එකකට ලකුණු 05 බැගිනි)

(මුළු ලකුණු 15)

@@@@@@@@@